සැ. යු.-2015.12.04 දින පළවූ අංක 1944 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,945 - 2015 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා - 2015.12.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1324 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1325 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 දෙසැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1321- B 81011—5,402 (2015/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | තඹලගමුව | තඹලගමුව බටහිර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය. |

12-320

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | තඹලගමුව | මොල්ලිපොතාන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

12-288

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණකරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 11 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | පස්සර | යටිකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

12-351

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය

**උසස් තාක්‍ෂණ ආයතන සහ ආයතන අංශ සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2016 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2014 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්පත් :*

ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රුපියල් පන්සීය (රු. 500) ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-2-001-1-3397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතන ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයැදුම්පත ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම් අයදුම් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රුපියල් පන්සියය (රු. 500) ක වටිනාකමකින් යුත් කුවිතාන්සි අයැදුම්පත්‍රයේ අදළ කොටුව තුළ අලවා අයදුම්පත් ඉදිරිපත්කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්‍ෂේප කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට 2016.01.15 පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

"ආ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර, අයැදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "අ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන (Full Time) පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන (Part-time) පාඨමාලා සඳහා සමාසික ගාස්තු (Semester) පහත පරිදි වේ. :

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. | රු. 5,000 |
| උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. | රු. 8,000 |
| උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. | රු. 12,000 |

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. ශිෂ්‍යයන් තෝරා ගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. අවශ්‍ය මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය. සහතිකවල මුල් පිටපත් නොමැති අවස්ථාවල දී සහතික කරන ලද ඡායා පිටපත්, ලියාපදිංචි වීමේ දී මුල් පිටපත් ඉදිරිපත් කරන කොන්දේසිය යටතේ භාරගනු ලැබේ.

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා ගම්පහ උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ හා කොළඹ උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

එක් එක් පාඨමාලාවන් සඳහා ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම් :

*" අ" කොටස*

01. **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - සිවිල් (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - විදුලි (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - යාන්ත්‍රික (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි**
**(සිවිල්/විදුලි/යාන්ත්‍රික ඉංජිනේරු)**

**උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ගො. සේ. ඉ. ඩි.) - (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) (උ. ජා. ප්‍ර. මි. ස. ඩි.) - කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-*

(i) අ. පො. ස. (උ/පෙළ) ගණිතය විෂය ධාරාව යටතේ විෂයයන් තුනම එක් වරකදී සමත්ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

02. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය.*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය යටතේ ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයය ඇතුළත්ව විෂයයන් තුනම එක්වරක දී සාමාර්ථය ලබා තිබීම, මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතු ය.

අ. පො. ස. (උ./පෙළ) විභාගයේ දී ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

2. 1 **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. (අර්ධ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ (නව නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් තුනකින් සමත් වී තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

*ප්‍රායෝගික පළපුරුද්ද .—* අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතු ය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එම පාඨමාලාවේ II වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ව්‍යාපාර මූල්‍ය සමත්ව තිබීම;

(ii) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය/කළමනාකරණ ඩිප්ලෝමාව සමත්ව තිබීම;

(iii) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාවේ දෙවන වසර සමත්ව තිබීම;

(iv) අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධිය (ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලන/අලෙවි කළමනාකරණ/ මානව සම්පත් කළමනාකරණ/ ව්‍යාපාර මූල්‍ය/ව්‍යාපාර ආර්ථික විද්‍යා);

(v) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්‍ෂණය සමත්ව තිබීම;

(vi) වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්‍ෂණය සමත්ව තිබීම;

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්‍ෂණය සමත්ව තිබීම;

(viii) සහතිකලත් කළමණාකරන ගණකාධිකාරි ආයතනයේ අවසාන විභාගය සමත්ව තිබීම.

**03. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ක. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සියලුම විෂයයන්ගෙන් සමත්වීම;
(ගණිතය, ජීව විද්‍යාව සහ වාණිජ්‍යය යන විෂයය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා. /පෙළ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ස. ස. ක. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සියලුම විෂයයන්ගෙන් සමත්වීම;

(ගණිතය, ජීව විද්‍යාව සහ වාණිජ්‍යය යන විෂයය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ව්‍යා. ප. ඩි. (පූර්ණ කාලීන) — කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍යය විෂයය ධාරාවෙන් එක්වරක දී සමත්වීම.

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*සහ*

අ. පො. ස. (සා./පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**06. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි)/ අර්ධ කාලීන - කාලය වසර 2 1/2යි)**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරක දී සමත්ව තිබීම.

(ගණිතය, ජීව විද්‍යාව සහ වාණිජ්‍යය යන විෂය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.);

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සැලකිය යුතුයි :-*

(අර්ධ කාලීන සිසුන් සඳහා පමණක්), තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතු ය.

**07. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) - උ. ජා. තා. ඩි. (කෘෂි) (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-*

(i) එක් වතාවක දී අ.පො.ස. (උ./පෙළ.) විභාගය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික

විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම;

*සහ*

(ii) අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**08. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. (පූර්ණ කාලීන 2 1/2/අර්ධ කාලීන - කාලය වසර 2 යි.)**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක්වරක දී සමත්ව වී තිබීම සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය හෝ ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි);

*හෝ*

(iii) අ. පො. ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

(සැ. යු.—අර්ධ කාලීන අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතු ය.)

**09. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා- උ. ජා. ව. මූ. ඩි. - (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2 යි**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය :-*

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් 2ක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක් වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ගණකාධිකරණ ජාතික සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**10. උසස් ජාතික ආහාර තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. ආ. තා. තා. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-*

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයය ධාරාවන් යටතේ විෂයයන් තුනම එක් වරක දී සමත් ව තිබිය යුතු ය;

*සහ*

අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

## *"ආ" කොටස*

***උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ලිපිනයන්, දුරකථන අංක හා පවත්වන පාඨමාලා :***

| *සංකේත අංකය* | *ආයතන/ආයතන අංශය* | *ලිපිනයන්* | *දුරකථන අංක* | *පවත්වන පාඨමාලාවන්* |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්‍ෂණ ආයතනය, අම්පාර | ඉගිනියාගල පාර, අම්පාර | 063-2222056<br>063-2223035 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 02 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, අනුරාධපුරය | උක්කර 111,<br>අනුලා මාවත, පණ්ඩුලගම,<br>අනුරාධපුරය | 025-2234417 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා) |
| 03 | උසස් තාක්‍ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි, උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 04 | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව | ප්‍රධාන වීදිය, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති | 065-2247519 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පූ. කා.) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල | අංක 51 වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මු. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, යාපනය | අංක 665/5 වෙරළ පාර, යාපනය | 021-2222595<br>021-2229803 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා, තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. (පූ. කා.) |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644<br>081-2232097 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ.ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. ස. ස. ක.ඩි. |
| 08 | කෑගල්ල උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල | බංඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297<br>035-2221713 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911<br>037-2229583 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 10 | ගාල්ල උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2227880<br>091-2246179 | උ. ජා. ඉ. ඩි, උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි (අ. කා), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ගෙ. සේ. ඉ. ඩි. |
| 11 | උසස් තාක්ෂණ ආයතනය, කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15. | 011-2529479<br>011-2521282 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ගෙ. සේ. ඉ.ඩි. |
| 12 | උසස් තාක්ෂණ ආයතනය, ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. තා. ඩි. (කෘෂි) උ. ජා. ආ. තා. ඩි. |
| 13 | උසස් තාක්ෂණ ආයතනය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492<br>045-2231493 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (අ. කා.) |
| 14 | උසස් තාක්ෂණ ආයතන අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා) |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 15 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය, තංගල්ල | 0472241842 0472241843 0472241844 | උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ග. ඩි. (පූ. කා) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 16 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය | 026-2223232 026-2050617 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.) |
| 17 | උසස් තාක්‍ෂණ ආයතනය, වවුනියාව | ඒ 9 පාර, වේපන්කුලම් ඔමාන්තායි වවුනියාව. | 024-2052733 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |

*සැළකිය යුතුයි :*

(1) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා, උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්‍ෂණ ඩිප්ලෝමා, උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාවන් සඳහා අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගි වීමට නිදහස් විය යුතු අතර, සති අන්තයේ දී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගි වීමට හැකි විය යුතු ය.

(2) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ දේශන පළමු සහ දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර සති අන්තයේ ද පවත්වනු ඇත.

(3) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ (පූර්ණකාලීන) දේශන පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී ද, තෙවන වසර සඳහා සති අන්තයේ දී පවත්වනු ඇත.

(4) අ.පො.ස. (උ.පෙළ) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.

(5) අදාළ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙළ.) හෝ Z-Score සැළකිල්ලට ගනු ලැබේ.

(6) සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(7) පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(8) අදාළ උසස් තාක්‍ෂණ ආයතනයක හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයක ඕනෑම පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 50ක් ලියාපදිංචි වීම අනිවාර්ය විය යුතුවේ.

(9) අදාළ උසස් තාක්‍ෂණ ආයතනයක හෝ ආයතන අංශයක පැවැත්වෙන පාඨමාලාවක් සඳහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන අයදුම්පත් ප්‍රමාණයක් වේ නම්, එම ආයතන විසින් පවත්වන යෝග්‍යතා විභාගයක් මගින් නියමිත ශිෂ්‍ය සංඛ්‍යා බඳවා ගනු ලැබේ.

(10) කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතනය අංශයකට මාරු කරනු නොලැබේ.

(11) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අවුරුදු 03ක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවකට ලියාපදිංචි වන ශිෂ්‍යයෙකුට විශ්ව විද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට හැකිවන පරිදි තම ලියාපදිංචිය, ලියාපදිංචි වීමට අදාළ ආයතනය විසින් දී ඇති අවසාන දින සිට **දින 60ක කාලයක්** ඇතුළත අවලංගු කිරීමට ඉඩ ලබාදිය හැකි ය.

***සටහන :***

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.01.15 වේ.

Web site : www.sliate.ac.lk

ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්‍ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

*Office use only –* Course Number :..........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSES IN YEAR — 2016***

*Name of the Course in the Order of Preference*

1. ........................................................................
2. ........................................................................
3. ........................................................................

1. Name with initials :————.

2. Name/Names denoted by Initials :————.

3. Address :————.

4. Date of Birth : Year :————., Month :————., Date :————.

   Age (as at 15.01.2016) : Years :————., Months :————., Days :————.

5. National Identity Card No. :————.

6. Sex : ————.

7. Administrative District :————. Contact Phone Number :————.

8. (i) Results of GCE (Advanced Level) Examination (on or before 2014)

   Year :————, Index No. :————. Medium :————.

| *Subjects* | *Grade* |
|---|---|
| 1. ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... |

Common General paper : Pass/Fail

Aggregate/Z-score of the above examination :————.

(ii) Result of GCE Ordinary Level Examination :

Year :————. Index No.:————. Medium :————.

| *Subjects* | *Grade* | *Subjects* | *Grade* |
|---|---|---|---|
| 1. ...................................... | ...................................... | 6. ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... | 7. ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... | 8. ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... | 9. ...................................... | ...................................... |
| 5. ...................................... | ...................................... | 10. ...................................... | ...................................... |

9. Highest Qualification in English as a subject :————.

10. Only for part-time Courses
Details of Present Employment :

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.
Date of Appointment :————.

I do hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that, I concurrently follow a full-time course at any other state institution. I do hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The bank receipt for Rs. 500 payable to SLIATE should be annexed.)

Affix the bank SLIP which you Paid to the Peoples Bank

Name of the Bank : People's Bank
Branch : Hyde Park Corner Branch, Colombo 02
Account No. : 025-2-001-1-3397613

12-393

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015

අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

02. අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් :

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව; *හෝ*
(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව; *හෝ*
(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව; *හෝ*
(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව; *හෝ*
(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,
(vi) රැකියා ක්ෂේත්‍රයට අදළව ජාතික හා වෘත්තීය කුසලතා ( NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම,
(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

03. වයස් සීමාව :

ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන්දිනය 1998.01.11 දින හෝ ඊට පෙර හා 1986.01.11 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

04. වෙනත් සුදුසුකම් :
(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක

සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) තනතුරට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු 01 හා 02 ඡේද යටතේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය පල කරන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

05. වැටුප් කාණ්ඩය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) අනුව එම්එන් 3-2006A මාසික වැටුප් පරිමාණය (රු. 15,005-4x180-6x240-11x320-20x360 — රු. 27,885) හිමි වේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ලිඛිත විභාගය :

| *විෂය අංකය* | *විෂයයන්* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 01 | 100 | 40% |
| 02 | පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 02 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01) | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ හැකියාව කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) (කාලය පැය 02) | වාහන අලුත්වැඩියා කිරීම, වාහන නඩත්තු කිරීම, වාහනවල දෝෂ නිගමනය කිරීම, ධාවනයට නුසුදුසු වාහන තීරණය කිරීම, වාහන අමතර කොටස් සවිකිරීම සම්බන්ධ ඇස්තමේන්තු සකස් කිරීම, වාහනවල ඉන්ධන දහනය, වාහන සේවා කිරීම, වාහන රක්ෂණය කිරීම, වාහන ධාවනයේදී ඇති වන අනතුරු හා අලාභ හානි ආදී තනතුරට අදළව තාක්ෂණික දැනුම මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය : මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් කොළඹ නගරයේ දී පමණක් පවත්වනු ලැබේ. (අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව මධ්‍යස්ථාන සංඛ්‍යාව තීරණය වේ.)

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බැලීම සඳහා පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකි. ලකුණු ලබා දෙනු නොලැබේ.

07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති වල විධිවිධාන අදළ වේ.
(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් විය යුතුය.
(iv) 2007.05.28 දිනැති 2007/7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව භාෂා අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

09. (i) අයදුම්පත් 2016.01.11 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත් 02 වන පිටුව අංක 08 සිට 13 දක්වාත් 03 වන පිටුව 14 සිට 15 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේදී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම්

ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත් කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

(vii) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද අදළ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතුය.

(viii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීමට ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ix) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාගයට පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. *විභාග ගාස්තු :*
විභාග ගාස්තුව රු. 500 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ අදයම් ශීර්ෂ 2003-02-13ට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමට ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ අදළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන අතර මුදල් ඇණවුම් සහ මුද්දර භාරගනු නොලැබේ.

12. මෙම නිවේදනය මඟින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 24 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) ☐

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අධ්‍යාපන අමාත්‍යාංශය***

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2015
Examination for Recruitment of Transport Officer for Ministry of Education - 2015

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය සිංහල - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.) දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 විවාහක/අවිවාහක යන වග : විවාහක -1
අවිවාහක -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ලිපිනය :
4.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
4.2 රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
4.3 පෞද්ගලික ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :————.

05. දුරකථන අංකය :
5.1 රාජකාරි :————.
5.2 පෞද්ගලික :————.

06. 6.1 වර්තමාන තනතුර හා සේවා ස්ථානය :————.
6.2 එම තනතුරට පත් වූ දිනය :————.

07. 7.1 උපන් දිනය

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

7.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස

අවුරුදු | | | මාස | | | දින | | |

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචි කිරීමකින් ද ?

09. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

9.1 අධ්‍යාපන සුදුසුකම් :

| *විභාගය* | *වර්ෂය* | *පෙනී සිටි ප්‍රධාන විෂයයන්* | *සාමාර්ථය* | *පාසලේ නම* |
|---|---|---|---|---|
| | | | | |

9.2 වෘත්තීය සුදුසුකම් :

| *විභාගය* | *වර්ෂය* | *පෙනී සිටි ප්‍රධාන විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

10. වෙනත් සුදුසුකම් :————.
11. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :————.
12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය
12.1 විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
12.2 ලදුපත් අංකය හා දිනය :————.
12.3 ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දරයකින් මෙහි අලවන්න.

13. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා තෝරාගැනීමට නුසුදුස්සෙකු වීමට යටත් බවත් පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............... නැමැති අය මා පෞද්ගලික වශයෙන් හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් 2015 ............ මස ............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය.)

15. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන මෙම ආයතනයේ ........................ තනතුර දරන ........................ මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නැති බවත් සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

12-452

## රාජ්‍ය භාෂා ප්‍රවීනතා ලිඛිත විභාගය - 2016

සිංහල/දෙමළ - I/II/III/IV වන මට්ටම

**(ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව රාජ්‍ය නිලධාරින්ගෙන් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2014 ප්‍රකාරව සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයක්හි නිලධාරින්ගෙන් රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

02. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අතර, විභාගය සමත්වීම සඳහා ලකුණු 40%කට නොඅඩුව ලබා ගත යුතු වේ. **මෙම විභාගයේ පිළිතුරුපත් නැවත සමීක්ෂණය නොකෙරේ.** එසේම විභාග ප්‍රතිඵල ඒ ඒ අපේක්ෂකයන් වෙත දන්වා නොයැවෙන අතර, එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. (**වාචික පරීක්ෂණයට ඉල්ලුම් කළ හැක්කේ ලිඛිත විභාගය සමත්වූ අයට පමණි.**)

03. ඔබගේ අවශ්‍යතාව අනුව 2015.11.30 දින සිට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www. languagesdept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක් මෙම විභාගයට අයදුම් කළ හැක. ඒ සඳහා වෙබ් අඩවියට පිවිස තිරයේ දිස්වන පියවර අනුගමනය කළ යුතුය. ඒ අනුව 2015 නොවැම්බර් 30 සිට 2016 ජනවාරි 31 දක්වා ලැබෙන අයදුම්පත් සඳහා 2016 මාර්තු මාසයේ ද, 2016 පෙබරවාරි 01 සිට ජූලි 31 දක්වා ලැබෙන අයදුම්පත් සඳහා 2016 සැප්තැම්බර් මාසයේ ද රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය පවත්වනු ලැබේ. එක් අයදුම්කරුවෙකුට එක් වරකදී අයදුම් කළ හැක්කේ එක් භාෂාවක එක් මට්ටමකට පමණි. (**ඉතා වැදගත් - තැපෑලෙන් ඉල්ලුම්පත් භාර ගැනීමක් සිදු නොකෙරේ.**)

04. ඒ ඒ සේවාවන්ට අයත් නිලධාරින් විසින් භාෂා ප්‍රවීණතාව ලැබීම සඳහා සමත් විය යුතු ප්‍රවීණතා මට්ටම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 හා කළමනාකරණ සේවා චක්‍රලේඛ 04/2014 අනුව තහවුරු කර ගත යුතුය. එකී චක්‍රලේඛ, අදාළ විෂය නිර්දේශ, හා අදාළ අනෙකුත් විස්තර ඉහත වෙබ් අඩවියෙන් ම ලබාගත හැක.

05. විශේෂ අවශ්‍යතා සහිත අයෙකු නම්, ඒ පිළිබඳ විස්තර අයදුම්පත්‍රයේ ඇතුළත් කළයුතුය.

06. **සෑම අයදුම්කරුවෙක්ම රු. 500 ක** විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු කාර්යාලයකින් **''රාජගිරිය, ලංකා බැංකුවේ රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ අංක 7041541 දරන ගිණුමට බැර කර ලබාගත් ලදුපතෙහි පරිගණකයෙන් මුද්‍රිත අංකය හා දිනය අයදුම්පතේ අදාළ කොටුව තුළ සඳහන් කළයුතුය.**

07. ලිඛිත විභාගය සඳහා දිවයිනේ ඒ ඒ පළාත්වල විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක ඇමුණුම් 01 හි සඳහන් වේ. යම් නගරයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම විභාග මධ්‍යස්ථාන අවලංගු කර, අයදුම්කරුවන් ඉල්ලා ඇති දෙවන/තුන්වන කැමැත්තට අනුව විභාග මධ්‍යස්ථාන වෙත යොමු කෙරේ.

08. අපේක්ෂකයින් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදන පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුව ද ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය.

09. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. යම් හෙයකින් එසේ අනන්‍යතාව තහවුරු නොකොට විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ ඒ පිළිබඳ විමර්ශනයක් සිදුකිරීමෙන් පසුව අනන්‍යතාව තහවුරු වන්නේ නම් පමණි.

11. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ලිඛිත විභාගය සම්බන්ධයෙන්, ඉහත සඳහන් නොවන කරුණු පිළිබඳ අවසාන තීරණය ද අදළ පරිදි විභාග කොමසාරිස් ජනරාල් හා/හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් සතුය.

12. ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
රාජ්‍ය භාෂා කොමසාරිස්.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
"භාෂා මන්දිරය"
අංක 341/7, කෝට්ටේ පාර
රාජගිරිය.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| ........................ |

*රාජ්‍ය භාෂා ප්‍රවීනතා ලිඛිත විභාගය - 2016*
*සිංහල/දෙමළ (I, II, III, IV මට්ටම්)*
*ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව*
Written Examination for Official Languages Proficiency - 2016
Level I, II, III, IV (Sinhala/Tamil)
Department of Examinations Sri Lanka/Department of Official Languages

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන
දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය (කැමැත්තේ අනුපිළිවෙලට)
(නිවේදනයේ අංක 01 ඇමුණුමට අනුව)

| | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු භාෂා මාධ්‍යය සිංහල - 2
(ප්‍රවීණතාව ලබාගතයුතු භාෂාවට අදළ අංකය කොටුව තුළ ලියන්න) : දෙමළ - 3

ඉල්ලුම්කරන මට්ටම :
(ප්‍රවීනතාව ලබා ගත යුතු මට්ටමට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

I මට්ටම - 1
II මට්ටම - 2
III මට්ටම - 3
IV මට්ටම - 4

**සැ. යු.-ප්‍රවීනතාව ලබා ගත යුතු භාෂාව හා ඉල්ලුම් කරන භාෂා මට්ටම නිවැරදිව ඇතුළත් කිරීම අනිවාර්ය වන අතර එය කිසිම හේතුවක් නිසා පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.
(උදා : සමරසිංහ ආරච්චිගේ සමන් කුමාර සමරසිංහ)

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උද : SAMARASINGHE ARACHCHIGE SAMAN KUMRA SAMARASINGHE )

3. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
(උද : SAMARASINGHE, S. A. S. K.)

4. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍රය හා ප්‍රතිඵල ලේඛනය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

5. සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය :————.
(නිවේදනයේ අංක 01 ඇමුණුම අනුව දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය ඇතුළත් කරන්න.)

6. ජාතික හැඳුනුම්පත් අංකය :

7. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ 0
ස්ත්‍රී 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

8. දුරකථන අංකය :

9. විද්‍යුත් තැපැල (ඊ-මේල් ලිපිනය) :————.

10. ස්ථිර තනතුර :————.

11. ඔබ විශේෂ අවශ්‍යතා සහිත නිලධාරියෙක් ද? ඔව්/නැත

11. 1. පිළිතුර ඔව්නම් : ශ්‍රවණාබාධිත - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) දෘශ්‍යාබාධිත - 1

12. **01/2014 හෝ 04/2014 චක්‍රලේඛය අනුව ඔබ අයත් ප්‍රවීණතා මට්ටම** :————.

13. විභාග ගාස්තුව : රු. ............ ගෙවූ බැංකු ශාඛාව :————.

පරිගණක මුද්‍රිත අංකය :

ගෙවූ දිනය :————.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, විභාග නීතිරීතිවලට යටත්වන බවත්, විභාගයට අදළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත්, විභාගයට අදළ සියලු කොන්දේසි කියවා තේරුම්ගත් බවත් මා මෙයින් ප්‍රකාශ කරමි.

එකග වෙමි.

දිනය :————.

ඇමුණුම - 01

විභාග මධ්‍යස්ථානය පිහිටුවන දිස්ත්‍රික්ක/නගර හා දිස්ත්‍රික් අංක/නගර අංක

| පළාත | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය/නගර අංකය |
|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 1 |
| | ගම්පහ | 2 |
| | කළුතර | 3 |
| වයඹ පළාත | කුරුණෑගල | 4 |
| | පුත්තලම (හලාවත) | 5 |
| දකුණු පළාත | ගාල්ල | 6 |
| | මාතර | 7 |
| | හම්බන්තොට (තංගල්ල) | 8 |
| සබරගමු පළාත | රත්නපුර | 9 |
| | කෑගල්ල | 10 |
| ඌව පළාත | බදුල්ල | 11 |
| | මොණරාගල | 12 |
| මධ්‍යම පළාත | මහනුවර | 13 |
| | මාතලේ | 14 |
| | නුවරඑළිය | 15 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 16 |
| | පොළොන්නරුව | 17 |
| උතුරු පළාත | යාපනය | 18 |
| | වවුනියාව | 19 |
| | මුලතිව් | 20 |
| | කිලිනොච්චිය | 21 |
| | මන්නාරම | 22 |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය | 23 |
| | මඩකලපුව | 24 |
| | අම්පාර | 25 |

12-500

---

**රජයේ පූර්ණ අනුමැතිය ලබා ඇති**

**කෘෂි තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව**

අර්ධ කාලීනව පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ එකම ආයතනය වන

**SRI LANKA TECHNICAL INSTITUTE AND DIYAGALA BOYS' /TOWN** ආයතනය

2016 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම දැන් සිදු කෙරේ.

සම්මුඛ පරීක්ෂණය :2016 ජනවාරි මස 03 වැනි ඉරිදා උදේ 10.00 ට
විමසීම : 0728173632

Sri Lanka Technical Institute & Diyagala Boys' Town
Tewatte, Ragama, Sri Lanka

Telephone : 94 11 4817525
Email : diyagala@sltnet.lk

Tel/fax : 94 11 2955399
Web : www.diyagalaboystown.org.lk

12-412

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**2016 වර්ෂයට ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙකුත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්ට, ආයතනයන්ට වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 2016 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භකර තිබේ. එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා, සංකේත අංක යටතේ පහත දක්වා තිබේ. NVQ මට්ටම, පාඨමාලා ගාස්තු හා පාඨමාලා කාලය ද සඳහන් කර ඇත.

පාඨමාලා සඳහා අයදුම් කිරීම :

දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික වෘත්තීය පුහුණු ආයතනවල ලිපිනය හා ක්‍රියාත්මක පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබෙන අතර ඔබ කැමති පාඨමාලාවක් තෝරාගෙන අදාළ දිස්ත්‍රික්කයට/ජාතික වෘත්තීය පුහුණු ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම් පතක් යොමු කළ යුතුය. මේ සමඟ ඉදිරිපත් කෙරෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව 13"x 8" ප්‍රමාණයෙන් සකස් කළ යුතු වේ. ඔබ විසින් අයදුම්පත යොමු කරන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආධුනිකයන් බඳවා ගැනීම - 2016 අයදුම්පත් යොමු කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2015 දෙසැම්බර් 31
පාඨමාලා ආරම්භය - 2016 ජනවාරි 11

වැඩි විස්තර සඳහා :
දුරකථන අංක - 011-7270270
011-2352185
011-2352160

Fax අංක - 011 2502342
Email ලිපිනය - cgjp@vtasl.gov.lk
වෙබ් ලිපිනය - www.vtasl.com
ෆේස්බුක් පිටුව - www.facebook.com/vtasl

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
04 වන මහල,
නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

***ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ***
*පුහුණුව සමඟ ඔබට*

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබා ගැනීමේ අවස්ථාව
- විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසිකව රු. 1,000 සිට 2,000 දක්වා මාසිකව දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම වාර ප්‍රවේශ පත්‍ර
- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තීය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- නොමිලේ පූර්ණ රක්ෂණ ආවරණයක්
- නොමිලේ නිල ඇඳුම්

*පුහුණුවෙන් පසු ඔබට*

- මාසික දීමනාවක් සමඟින් වැඩිදුර පුහුණුව
- රජයේ පිළිගත් සහතිකයක්
- විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම

- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමඟ ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළුව මගින් දැනුම යාවත්කාලීන කිරීම
- වෘත්තීය අධ්‍යාපනය තුළින් කාර්මික ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව

***ආදර්ශ අයදුම් පත්‍රය***

*ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය*

**2016 වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————.

2. ලිපිනය :————————.

3. පදිංචිය :————————.
   (i) ග්‍රාමසේවා වසම :————————.
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————.
   (iii) දිස්ත්‍රික්කය :————————.

4. දුරකථන අංකය :————————.

5. උපන් දිනය :————————.

6. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :————————.

ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථානය අනුපිළිවෙළින් සඳහන් කරන්න.

| පාඨමාලා | අදාළ මධ්‍යස්ථානය |
|---|---|
| (i) ..................................... | (i) ........................................ |
| (ii) ..................................... | (ii) ........................................ |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

.............................. ..............................
දිනය අයදුම්කරුගේ අත්සන

ඔබගේ අයදුම්පත් පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂගේ ලිපිනයට 2015.12.31 වැනි දිනට පෙර යොමු කරන්න.

**පාඨමාලාව හැදෑරීම සඳහා අවම සුදුසුකම්**
**09 වසර සමත්වීම** (Pass year 09)

- ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - ජාතික සහතිකය
- ජලනල කාර්මික - ජාතික සහතිකය
- උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය
- ලී කැටයම් ශිල්පී
- ලී වැඩ කාර්මික ශිල්පී
- මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය
- මෝටර් රථ වෑද්දුම් ශිල්පී - ජාතික සහතිකය
- යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය
- ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය
- කෘෂි යන්ත්‍ර හා උපකරණ කාර්මික - ජාතික සහතිකය
- පලතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම්කරු - ජාතික සහතිකය
- කාමර සේවක - ජාතික සහතිකය
- ලෝහ පිරිසැකසුම්කරු - ජාතික සහතිකය
- පැස්සුම් ශිල්පී - ජාතික සහතිකය (මාස 18/30)
- ස්වර්ණාභරණ කාර්මික(අත් නිමැවුම්) - ජාතික සහතිකය

- ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය
- මැණික් කැපුම් ශිල්පී
- තවාන් පාලනය හා පැල බද්ධකරු
- මල් හා විසිතුරු පැළ වගාකරු
- එළවළු හා පලතුරු වගාකරු
- අධිවේගී මහන යන්ත්‍ර කාර්මික - ජාතික සහතිකය
- අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය
- ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය
- තිර මුද්‍රණකරු
- ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය
- ෆැබ්රික් කටර් - - ජාතික සහතිකය
- සම් පාවහන් නිෂ්පාදක - ජාතික සහතිකය
- රබර් නිෂ්පාදක
- රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය
- කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය

*අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06 කින් සමත්වීම*

- ඉදිකිරීම් වැඩ කළමනාකරණය
- සැලසුම් ශිල්පී - ජාතික සහතිකය
- මෝටර් කාර්මික ශිල්පි - ජාතික සහතිකය
- මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - ජාතික සහතිකය
- මෝටර් රථ වායු සමීකරණ ශිල්පී - ජාතික සහතිකය
- විදුලි ශිල්පී - ජාතික සහතිකය
- ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය
- ජංගම දුරකථන අළුත්වැඩියා කිරීම
- වෘත්තීමය බේකරි ශිල්පී (බේකරි ශිල්පී - ජාතික සහතිකය හා වෘත්තීය පුහුණු අධිකාරි සහතිකය) (නාරාහේන්පිට)
- ශීතකරණ හා වායුසමීකරණ කාර්මික- ජාතික සහතිකය
- වෘත්තීය සූපවේදී (සූපවේදී ජාතික සහතිකය සහ වෘ. පු. අ. සහතිකය)(නාරාහේන්පිට)
- පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය
- ග්‍රැපික් නිර්මාණ ශිල්පී -ජාතික සහතිකය(නාරාහේන්පිට)
- ග්‍රැපික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය
- යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය
- යන්ත්‍ර ශිල්පී (ලියවන පට්ටල් ක්‍රියාකරු)- ජාතික සහතිකය
- මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය
- ඇඟලුම් නිෂ්පාදන සුපරීක්ෂක - ජාතික සහතිකය
- ඇඟලුම් තත්ත්ව පාලක - ජාතික සහතිකය
- ෆැබ්රික් ඉන්ස්පෙක්ටර් - ජාතික සහතිකය

*අ. පො. ස. (උ. පෙළ) විෂයයන් 03 කින් සමත්වීම*

- සැලසුම් ශිල්පී - ජාතික ඩිප්ලෝමාව

*අ. පො. ස. (උ. පෙළ) විෂයයන් 02 කින් සමත් වීම*

- සහකාර ප්‍රමාණ සමීක්ෂණ - ජාතික සහතිකය

*අ. පො. ස. (උ. පෙළ) ගණිතය හෝ විද්‍යාව අංශයෙන් විෂයයන් 03 කින් සමත්වීම හෝ NVQ 4 සුදුසුකම්*

- ප්‍රමාණ සමීක්ෂක -ජාතික ඩිප්ලෝමාව

*අ. පො. ස. (සා. පෙළ) පෙනී සිටීම*

- ලී වැඩ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ)- ජාතික සහතිකය
- ලී වැඩ කාර්මික ශිල්පි (ගොඩනැගිලි)- ජාතික සහතිකය
- විදුලි ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
- ගෘහ විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය
- විදුලිමෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය
- බේකරි ශිල්පි - ජාතික සහතිකය
- සූපවේදී - ජාතික සහතිකය
- භෝජනාගාර සේවක - ජාතික සහතිකය
- ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික - ජාතික සහතිකය

- ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය
- මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්)- ජාතික සහතිකය

*09 වසර සමත්වීම හා අවුරුදු 21ට වැඩිවීම හා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය ලබා වසර 03 ක් ගතව තිබීම.*

- රියදුරු (බර වාහන)

*09 වසර සමත්වීම හා අවුරුදු 18ට වැඩිවීම*

- රියදුරු (සැහැල්ලු වාහන)

*අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 03කින් සමත්වීම*

- කෘෂි යන්ත්‍ර උපකරණ කාර්මික - ජාතික සහතිකය
- වැද්දුම්කරු (සාමාන්‍ය)
- පෑස්සුම් ශිල්පි - ජාතික සහතිකය (මාස 18)

*අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව අතුළුව විෂයයන් 06 කින් සමත්වීම*

- ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය
- වායුපීඩක තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය

*අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම*

- පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය +A සහතිකය
- CISCO Computer Networking Course(CCNA)
- "Adobe " වෘත්තීය සහතික පාඨමාලාව
- මෘදුකාංග පාඨමාලාව
- ලේකම් පරිචය

*ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2L3සහතික ලබා තිබීම*

- යන්ත්‍ර ශිල්පී (CNC මෙහෙයුම් යන්ත්‍ර ක්‍රියාකරු) - ජාතික සහතිකය
- යන්ත්‍ර ශිල්පී (CNC මෙහෙයුම් යන්ත්‍ර ලියවන පට්ටල් ක්‍රියාකරු) - ජාතික සහතිකය

*ජාතික වෘත්තීය සුදුසුකම් පෑස්සුම්කරු L3 සහතික ලබා තිබීම*

- පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය

*අ. පො. ස. (උ. පෙළ) සමත්වීම*

- වැඩ අධ්‍යයන නිලධාරි - ජාතික සහතිකය

*පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතුවීම හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික, වැඩ මූලික සහායක, වැඩ අධීක්ෂක රැකියාවක වසර 02 ක පළපුරුද්ද තිබීම.*

- කාර්මික කළමණාකරණ ඩිප්ලෝමා

*ජාතික වෘත්තීය සුදුසුකම් තොරතුරු සහ සන්නිවේදන ඩිප්ලෝමා පත්‍ර පාඨමාලාව*

- ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06කින් සමත්වීම හා ICT NVQ 4 සහතිකය ලබා තිබීම හෝ උසස් පෙළ සමත්වීම

*ජාතික වෘත්තීය සුදුසුකම් තොරතුරු සහ සන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාව*

- ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06කින් සමත්වීම.

*ජාතික වෘත්තීය සුදුසුකම් මෝටර් රථ කාර්මික පාඨමාලාව*

- අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත්වීම

*Cosmetology ඩිප්ලෝමා පාඨමාලාව*

- NVQ 4 සහතිකය ලබා තිබීම.

අයදුම්පත් 2015.12.31 දිනට පෙර තෝරාගත් දිස්ත්‍රික්කවල සහකාර අධ්‍යක්ෂ වෙතට යොමු කරන්න.

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ) | NVQ Levels | Fee |
|---|---|---|---|---|
| | **මෝටර් රථ අළුත්වැඩියාව සහ නඩත්තුව** | | | |
| 1 | මෝටර් කාර්මික - ජාතික සහතිකය | 36 | 4 | 8,000 |
| 2 | මෝටර් කාර්මික - ජාතික සහතිකය | 24 | 3 | 5,000 |
| 3 | මෝටර් රථ විදුලි කාර්මික - ජාතික සහතිකය | 24 | 3,4 | 6,000 |
| 4 | මෝටර් රථ වායු සමීකරණ ශිල්පි - ජාතික සහතිකය | 12 | 3,4 | 4,500 |
| 5 | රියදුරු (බර වාහන) | 6 | Non | 10,500 |
| 6 | රියදුරු (සැහැල්ලු වාහන) | 6 | Non | 12,000 |
| 7 | මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 8 | මෝටර් රථ වෑද්දුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 9 | යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | 2,500 |
| 10 | ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී | 12 | 3,4 | 2,500 |
| 11 | කෘෂි උපකරණ කාර්මික - ජාතික සහතිකය | 24 | 3 | Free |
| 12 | ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරු(ස්කැවේටර්/බැකෝ ලෝඩර්/මෝටර් ග්‍රේඩර්) | 2 | Non | යන්ත්‍ර අනුව |
| | ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරු(ස්කැවේටර්/බැකෝ ලෝඩර්/මෝටර් ග්‍රේඩර්) | 2 | 4 | වෙනස් වේ. |
| | **විදුලි විද්‍යුත් සහ විදුලි සංදේශ** | | | |
| 14 | විදුලි ශිල්පී - ජාතික සහතිකය | 24 | 3,4 | 4,500 |
| 15 | විදුලි ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 | Free |
| 17 | ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා | 24 | 3 | Free |
| 18 | විදුලිමෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 19 | ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා | 24 | 4 | 6,000 |
| 20 | ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා | 24 | 3,4 | 5,000 |
| 21 | වායුපීඩක තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | 24 | 4 | 8,000 |
| 22 | ජංගම දුරකථන අළුත්වැඩියා කරන්නා | 12 | Non | Free |
| 22A | Instrument Technician | 24 | Non | 5,000 |
| | **තොරතුරු තාක්‍ෂණ සන්නිවේදනය තාක්‍ෂණය** | | | |
| 24 | පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය CISCO +A+ සහතිකය | 12 | 4 | 13,500 |
| 25 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව | | | |
| | (NVQ Level 4 in ICT) | 12 | 4 | 9,000 |
| 27 | ජාතික තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | | | |
| | (NVQ Level 5 in ICT) | 24 | 5 | 42,000 |
| 28 | පරිගණක ජාල පාඨමාලාව (CISCO networking) | 24 | 4/Non | 41,500 |
| 29 | මල්ටිමීඩියා ඩිවලපර් | 24 | Non | 20,000 |
| | මෘදුකාංග සංවර්ධන ශිල්පී | 24 | Non | 20,000 |
| 30 | වෙබ් ඩිවලපර් / ඩිසයිනර් | 24 | Non | 20,000 |
| | පරිගණක පද්ධති පාලන ශිල්පී | 24 | Non | 20,000 |
| 30 A | මෘදුකාංග පාඨමාලාව-ජාතික සහතිකය(නාරාහේන්පිට) | 12 | 4 | 21,500 |
| 31 | ග්‍රැපික් නිර්මාණ ශිල්පී -ජාතික සහතිකය(නාරාහේන්පිට) | 12 | 4 | 14,000 |
| 32 | ග්‍රැපික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 4 | 11,500 |
| 32 A | ග්‍රැපික් නිර්මාණ ශිල්පී (ශ්‍රවනාබාධිත)(නාරාහේන්පිට) | 12 | 4 | Free |
| | **හෝටල් හා සංචාරක** | | | |
| 33 | වෘත්තීය සුපවේදි ජාතික සහතිකය(නාරාහේන්පිට) | 12 | 4 | 31,500 |
| 34 | සුපවේදී ජාතික සහතිකය | 12 | 4 | 7,500 |
| 35 | සුපවේදී ජාතික සහතිකය | 12 | 3 | 4,500 |
| 36 | කාමර සේවක - ජාතික සහතිකය | 12 | 3 | 5,000 |
| 37 | භෝජනාගාර සේවක - ජාතික සහතිකය | 12 | 3,4 | 6,000 |
| | **මැණික් හා ස්වර්ණාභරණ** | | | |
| 38 | ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය | 12 | 3 | Free |

| *පාඨමාලා අංකය* | *වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ)* | *NVQ Levels* | *Fee* |
|---|---|---|---|---|
| 39 | ස්වර්ණාභරණ කාර්මික(අත් නිමැවුම්) -ජාතික සහතිකය | 24 | 3,4 | Free |
| | ස්වර්ණාභරණ කාර්මික(අත් නිමැවුම්) | 24 | Non | Free |
| | **පුද්ගල හා සමාජ** | | | |
| 41 | රූපලාවන්‍ය ශිල්පි - ජාතික සහතිකය | 6 | 4 | 8,500 |
| 42 | රූපලාවන්‍ය ශිල්පි - ජාතික සහතිකය(නාරාහේන්පිට) | 0 | 4 | 22,000 |
| 43 | රූපලාවන්‍ය ශිල්පි - ජාතික සහතිකය | 6 | 3 | 4,500 |
| 44 | කොණ්ඩා සැකසුම් ශිල්පි -ජාතික සහතිකය(නාරාහේන්පිට) | 6 | 4 | 32,000 |
| 45 | කොණ්ඩා සැකසුම් ශිල්පි - ජාතික සහතිකය | 6 | 4 | 11,500 |
| 46 | කොණ්ඩා කැපුම් ශිල්පි- ජාතික සහතිකය | 6 | 3 | 5,500 |
| 46A | Cosmetology | 15 | 5 | 60,000 |
| 47 | පෙර පාසල් ගුරු - ජාතික සහතිකය | 24 | 3 | 10,000 |
| | **ආහාර තාක්ෂණය** | | | |
| 48 | වෘත්තිමය බේකරි ශිල්පි((නාරාහේන්පිට)) | 12 | 4 | 31,500 |
| 49 | බේකරි ශිල්පි - ජාතික සහතිකය | 12 | 4 | 7,500 |
| 50 | බේකරි ශිල්පි - ජාතික සහතිකය | 12 | 3 | 4,500 |
| 51 | පලතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම්කරු | 12 | 3 | Free |
| | **දැව ආශ්‍රිත** | | | |
| 52 | ලී කැටයම් ශිල්පි | 12 | Non | Free |
| 53 | ලී වැඩ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ)- ජාතික සහතිකය | 24 | 3,4 | Free |
| 54 | ලී වැඩ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ)- ජාතික සහතිකය | 12 | 3,5 | Free |
| 54A | ලී වැඩ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ) | 12 | Non | Free |
| | ලී වැඩ කාර්මික ශිල්පි (ගොඩනැගිලි)- ජාතික සහතිකය | 24 | 3,4 | Free |
| 55 | ලී වැඩ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ/ගොඩනැගිලි)- ජාතික සහතිකය | 36 | 4 | Free |
| | **රෙදිපිළි හා ඇඟලුම්** | | | |
| 56 | මෝස්තර නිර්මාණ ශිල්පි - ජාතික සහතිකය | 12 | 4 | 3,500 |
| 57 | මෝස්තර නිර්මාණ ශිල්පි - ජාතික සහතිකය | 12 | 3 | 3,000 |
| 58 | අධිවේගී මහන යන්ත්‍ර කාර්මික - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 59 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 6 | 3,4 | Free |
| 59A | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | 6 | Non | Free |
| 60 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | 12 | 2,3,4 | 3,000 |
| 61 | තිර මුද්‍රණකරු | 12 | Non | Free |
| 62 | ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 12 | 3,4 | 2,500 |
| 63 | ඇඟලුම් නිෂ්පාදන සුපරීක්ෂක - ජාතික සහතිකය | 12 | 3 | 7,000 |
| 64 | ඇඟලුම් තත්ව පාලක - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 65 | ඇඟලුම් තත්ව පාලක - ජාතික සහතිකය (German School) | 12 | 4 | 4,500 |
| 68 | වැඩ අධ්‍යයන නිලධාරි - ජාතික සහතිකය | 24 | 4 | 13,500 |
| | **ලෝහ හා ලුහු ඉංජිනේරු** | | | |
| 69 | යන්ත්‍ර ශිල්පි - ජාතික සහතිකය | 24 | 4 | 5,500 |
| 70 | යන්ත්‍ර ශිල්පි - ජාතික සහතිකය | 24 | 3 | 5,000 |
| 71 | යන්ත්‍ර ශිල්පි (ලියවන පට්ටල් ක්‍රියාකරු) | 12 | 3 | 4,000 |
| 72 | යන්ත්‍ර ශිල්පි(CNC මෙහෙලුම් යන්ත්‍ර ක්‍රියාකරු)නාරාහේන්පිට | 12 | 4 | 7,500 |
| 73 | යන්ත්‍ර ශිල්පි ( CNC මෙහෙලුම් යන්ත්‍ර සහ ලියවන පට්ටල් ක්‍රියාකරු) - ජාතික සහතිකය (නියාගම / වන්දාරමුල්ල) | 12 | 4 | 9,500 |
| 74 | වැද්දුම්කරු (සාමාන්‍ය) | 24 | Non | Free |
| 76 | පිරිසැකසුම් ශිල්පි (ලෝහ) | 24 | 2,3,4 | Free |
| 77 | පෑස්සුම් ශිල්පි - ජාතික සහතිකය | 24 | 4 | 4,600 |
| 78 | පෑස්සුම් ශිල්පි - ජාතික සහතිකය | 24 | 3 | Free |
| 79 | පෑස්සුම් ශිල්පි - ජාතික සහතිකය | 12 | 2,3 | Free |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමඟ) | NVQ Levels | Fee |
|---|---|---|---|---|
| 79A | පෑස්සුම් ශිල්පි | 12 | Non | Free |
| 80 | පෑස්සුම් ශිල්පි-(Gas/Arc & Mag)ජාතික සහතිකය(නියාගම) | 36 | 4 | 6,000 |
| | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | | |
| 75 | ඇළුමිනියම් පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 75A | ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පි | 12 | Non | Free |
| 82 | ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) - ජාතික සහතිකය | 12,18 | 3,4 | Free |
| 83A | ඉදිකිරීම් වැඩ කළමණාකරණය | 12 | Non | 8,000 |
| 84 | ජලනල කාර්මික - ජාතික සහතිකය | 12,18 | 3,4 | Free |
| 86 | සැලසුම් ශිල්පි - ජාතික සහතිකය | 24 | 3,4 | 7,000 |
| 87 | සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය | 12 | 4 | 27,000 |
| 88 | ප්‍රමාණ සමීක්ෂක -ජාතික ඩිප්ලෝමාව | 48 | 5,6 | 96,000 |
| 89 | උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| | **මුද්‍රණ සහ ඇසුරුම්** | | | |
| 90 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 12 | 4 | 7,500 |
| 91 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 12 | 2,3 | 5,000 |
| | **කෘෂිකර්ම වැවිලි සහ පශු සම්පත්** | | | |
| 92 | තවාන් පාලනය හා පැල බද්ධකරු | 12 | Non | Free |
| 94 | එළවළු හා පලතුරු වගාකරු | 12 | Non | Free |
| | **ශීතකරණ හා වායුසමීකරණ** | | | |
| 95 | ශීතකරණ හා වායුසමීකරණ කාර්මික- ජාතික සහතිකය | 24 | 3,4 | 5,000 |
| | **ධීවර හා මත්ස්‍ය වගාව** | | | |
| 96 | මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්) | 12,24 | 3 | Free |
| | **සම් ආශ්‍රිත නිෂ්පාදන** | | | |
| 97 | සම් පාවහන් නිෂ්පාදක - ජාතික සහතිකය | 12 | 3 | Free |
| | සම් භාණ්ඩ නිෂ්පාදක - (සම් බෑග්) | 12 | 3 | Free |
| 98 | රබර් නිෂ්පාදනය (ගම්පහ) | 12 | 4 | Free |
| | **කාර්යාල කළමණාකරණය** | | | |
| 99 | ලේකම් පරිචය | 18 | 4 | 7,000 |
| | **වෙනත්** | | | |
| 100 | කාර්මික කළමණාකරණ ඩිප්ලෝමාව (නාරාහේන්පිට) | 12 | Non | 25,000 |

| | *දිස්ත්‍රික්කය/ ජා.වෘ.පු.ආ* | *පාඨමාලා අංකය* |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය<br>අංක 354, ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට, කොළඹ 5<br>011 - 2592233 | 1, 4, 6,100,14, 25, 27, 28, 29, 30, 31, 32A, 33,37,42,44,47, 48, 69, 7, 72, 86, 88, 90, 30A, 99, 46A |
| 2 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය,<br>අංක 100 කඳවල පාර, රත්මලාන,<br>011-2638850 | 1, 3, 14, 19, 21, 24,25, 32, 53, 69, 7, 75, 77, 8, 86, 88, 89, 95, 99, 47, 22A |
| 3 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය,<br>මිරිජ්ජවිල, හම්බන්තොට<br>0472220501 | 6, 14, 20, 24, 25, 41, 45, 53, 76, 77, 86, 87, 89, 95, 99, 47 |
| 4 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය,<br>මාකුරුගොඩ පාර, බද්දේගම<br>091-2293119 | 14,18, 19, 24, 25, 27, 32, 34, 37, 49, 75, 84, 88, 99, 47 |

| | දිස්ත්‍රික්කය/ ජා.වෘ.පු.ආ | පාඨමාලා අංකය |
|---|---|---|
| 5 | සහකාර අධ්‍යක්ෂ, කොරියානු ශ්‍රී ලංකා ජාතික තාක්ෂණික විද්‍යාලය, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, නියාගම, තල්ගස්වල, ගාල්ල 091-2296445 | 1, 14, 19, 24, 25, 27, 43, 45, 47, 55, 69, 73, 80, 82, 84, 86, 95, 99 |
| 6 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, තලල්ල දකුණ, කෝට්ටේගොඩ, මාතර 041-2259331 | 1, 6, 14, 19, 24, 25, 34, 41, 45, 49, 53, 69, 75, 78, 82, 84, 86, 89, 95, 96, 99, 47 |
| 7 | සහකාර අධ්‍යක්ෂ, (කොළඹ) දිස්ත්‍රික් වෘ. පු. ම., මහාමේඝ පෙදෙස, මහරගම, 011-2844151 | 2,3,4,10,14,15,20,24,25,32,34,35,38,39,41,45,47,49, 55,59,59A,60,62,7,75,76,79,8,82,84,89,9,95,99 |
| 8 | සහකාර අධ්‍යක්ෂ, (ගම්පහ) දිස්ත්‍රික් වෘ. පු. ම., බණ්ඩාරනායක මාවත, වේයන්ගොඩ 033 -2294790 | 2, 3, 5, 6, 10, 14, 15,18, 20, 22, 24, 25, 32, 34, 35,36, 39, 41, 45, 50, 54, 54A, 55, 56, 58, 59, 60, 62, 70,75,75A, 78,79,79A, 89, 9, 95, 98, 47 |
| 9 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම., ටැල්බට් ටවුම, ගාල්ල 091-2234540 | 1, 2, 3, 94, 10, 12, 14,15,18,19, 20, 21, 24, 25,27,28, 32, 36,39,41,43,45, 46,51,53,54,56,58,59, 60, 61, 64, 65, 68, 70,75,78,79,82,84,86,87,89,9,91,95,96,97, 99, 47, 22A |
| 10 | සහකාර අධ්‍යක්ෂ, (කළුතර) දිස්ත්‍රික් වෘ. පු. ම., වැවල, හොරණ 034 -2263698 | 3,4,92,10,14,15,18,20,24,25,27,32,35,36,39,41,45, 50, 51,53,54,56,59,60,61,62,63,64,75,76,79,8 2, 84, 86, 89, 9, 95, 87, 99, 47 |
| 11 | සහකාර අධ්‍යක්ෂ, (මහනුවර) දිස්ත්‍රික් වෘ. පු. ම., ගන්නොරුව පාර, පේරාදෙණිය 081 -2387200,081 -3804599 | 2,10,12,14,15,18, 20, 24, 25, 27, 34, 35, 37, 41, 43, 45, 53, 54, 54A, 60, 70, 75, 78, 79, 79A, 82, 84, 86, 88, 89, 9, 95, 99, 47 |
| 12 | සහකාර අධ්‍යක්ෂ, (මාතලේ) දිස්ත්‍රික් වෘ. පු. ම., ඉනාමළුව, දඹුල්ල 066-2286683 | 2,10,11,14,15,20,24,25,27,34,35,37,41, 45, 50, 52, 54, 56, 60, 61, 70, 75,78, 82, 84, 86, 89, 9, 95, 99, 47 |
| 13 | සහකාර අධ්‍යක්ෂ, (පොළොන්නරුව) දිස්ත්‍රික් වෘ. පු. ම., නාගලකන්ද විහාර පාර, මින්නේරිය 011-3158918, 027-2245442 | 2, 3, 10, 11,14,15, 24, 25, 27, 43, 46, 50, 54, 59, 60, 70, 75, 78,79,82,86, 9, 95, 99, 47 |
| 14 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම., නුවර වැව පාර, අනුරාධපුරය 025-2221400 | 2,3,4,6,10,11,14,15,17,18,20,24,25,27,35, 37, 41, 43, 45, 46, 50, 54, 59, 60,70,75,79, 82, 84, 86, 87, 89, 9, 95, 97, 99, 47 |
| 15 | සහකාර අධ්‍යක්ෂ(ත්‍රිකුණාමලය) දිස්ත්‍රික් වෘ. පු. ම., යොවුන් මාවත, කන්තලේ 026-2234517 | 11, 14, 15, 25, 35, 43, 46, 54, 60, 75, 79, 82, 84, 99, 47 |
| 16 | සහකාර අධ්‍යක්ෂ, (බදුල්ල) දිස්ත්‍රික් වෘ. පු. ම., අඹේගොඩ, බණ්ඩාරවෙල, 057-2223043 | 2,3,10,11,14,15,18, 24, 25, 27,34,35,36,37,41,43,45,46, 50, 53, 54, 60, 64, 7, 70, 75, 76, 77, 79, 82, 83A, 84, 86, 9, 95, 99, 47 |
| 17 | සහකාර අධ්‍යක්ෂ, (මොණරාගල) දිස්ත්‍රික් වෘ. පු. ම., කුමාරදාස මාවත, වැල්ලවාය, 055-2274775 | 2,10,11,14,15,17,18,19,24,25,35,41,43,45, 46, 53,54, 60, 62, 71, 75, 78, 79, 82, 86, 9, 95, 99, 47 |
| 18 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කාර්‍යාලය, කොටුව, මාතර 041-2235950 | 2, 10, 14, 15,18, 25, 27, 32, 39, 41, 43, 45, 46, 53, 54, 56, 58, 60, 61, 64, 7, 75, 79, 8, 82, 84, 86, 9, 95, 99, 47 |
| 19 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම., සාරගම, කුරුණෑගල 037-2237436 | 2,4,10,14,15,20,24,25,27,35,39,41,43,45,46,52,53,54, 55,57,58,60,61,64,7,74,75,79,8, 82,84,86,89,9,95,99,47 |
| 20 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම., බල්ලපාන, ගලිගමුව නගරය, කෑගල්ල 035-2282565 | 2, 3, 6, 10, 14, 15, 17, 20, 24, 25, 27, 34, 35, 39, 41, 45, 50, 53, 54, 60, 7, 70,75, 77, 78, 79, 8, 82, 84, 86, 89, 9, 95, 99, 47 |

| | දිස්ත්‍රික්කය/ ජා.වෘ.පු.ආ | පාඨමාලා අංකය |
|---|---|---|
| 21 | සහකාර අධ්‍යක්ෂ, (පුත්තලම) දිස්ත්‍රික් වෘ. පු. ම., හලාවත පාර, මාරවිල 032-2254110 | 2,3,6,10,14,15,18,20,24,25,32,34,36,37,41,43,45 , 46, 49, 53, 60, 71, 73, 75, 78, 82, 84, 86, 87, 9, 95, 99, 47 |
| 22 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම.,හේනකඩුව, තංගල්ල, හම්බන්තොට 047-2241724 | 2,3,4,10,11,14,15,18,20,24,25,32,34, 35, 37, 41, 43, 45, 46,49, 54, 55, 56, 59, 60, 62, 7, 70,75, 78, 79, 8, 82, 84, 86, 87, 89, 9, 91, 95, 99, 47 |
| 23 | සහකාර අධ්‍යක්ෂ, (රත්නපුර) දිස්ත්‍රික් වෘ. පු. ම., පනාවැන්න, කහවත්ත 045-2274699 | 2,10,14,15,18,20,24,25,34,35,38,41,43,45, 46, 50, 53, 54, 56, 59, 60, 62, 75,79, 82, 86, 87, 9, 95, 99, 47 |
| 24 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම., මහවීදිය, නින්දවූර්, අම්පාර 067- 2250196, 067-2251155 | 2,3,6,10,14,15,18,20,24,25,27,34,35,36,37,41, 46, 49, 50, 53, 54, 59, 60, 62, 64, 75, 79, 82, 84, 86, 87, 9, 95, 99, 47 |
| 25 | සහකාර අධ්‍යක්ෂ, (මඩකළපුව) ජාතික/දිස්ත්‍රික් වෘ. පු. ම., ආයතනය, APC පාර, වන්දාරමුල්ල. 065 - 2240159 | 11,15,25,43,46,54,60,62,75,79,82,83A,84, 86, 88, 2, 10, 12, 14, 20, 27, 53, 69,73, 9, 95, 99, 47 |
| 26 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ. පු. ම., වෙඩබන් පාර, නුවරඑළිය 052-2223216 | 2,10,14,15,20,24,25,27,35,36,37,41,45,47, 60, 64, 69, 75,79,9,99 |

12-429

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.